// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2307/24 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල වන මම, එකී මණ්ඩලයට, කුරුණෑගල උතුරු නගර ජල සම්පාදන ව්‍යාපෘතියේ, අරන්කැලේ ජල කුළුණ ඉදි කිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

ආචාර්ය **කෙහෙළිය රඹුක්වැල්ල**,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/03/KG/522
2022 නොවැම්බර් මස 16 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 440, අරන්කැලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මීගහඇල ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින් මැන සකස් කරන ලද, අ.ග.පි. 2777, අතිරේක අංක 3 දරන පිඹුරේ කැබලි අංක 98න් කොටසක් ලෙස දැක්වෙන "ගල්කඩුල්ලයාය" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 30ක් පමණ වන ඉඩම් කොටස :

**මායිම්**

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස
*දකුණට* : පාර
*බටහිරට* : කැබලි අංක 114

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 1. එච්. කිරිහපු මහතා,
මන්නැහැක්ගම,
නිකදළුපොත.

EOG 11-0257

---

## නිවැරදි කිරීමයි

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

2022.03.04 දින අංක 2269/74 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ අංක 03-0763 දරන නිවේදනයේ සිංහල පිටපතෙහි ඉඩමට හිමිකම් කියන්නාගේ නම එස්. ඩී. විජේතුංග ලෙස මුද්‍රණ දෝෂයකින් පළවී ඇති අතර එය එස්. ඩී. විජේගුණසිංහ ලෙස නිවැරදි විය යුතු ය.

**සාරදී වික්‍රමරත්න,**
අධ්‍යක්ෂ (ඉඩම්),
ජල සම්පාදන අමාත්‍යාංශය.

EOG 11 - 257/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.